

# සමාගම් පවත්වන සුරතල් බළලා

මිනිසාට හිතෛෂී සත්ත්ව විශේෂ අතරට ගැනෙන ගෘහාශ්‍රිතව වෙසෙන බළලා මානව වර්ගයා සමඟ සහ ජීවනය ගොඩ නඟා ගත් දිනය මෙතැනයි කිව නොහැකි ය. පුරාණයේ පටන් මිනිසුන් සිය වෙළෙඳ කටයුතු සඳහා දේශ සංචාරය කළහ. එම නැවියන් විසින් මිසරයේ හීලෑ බළලුන් වෙනත් රටවලට හඳුන්වා දෙනු ලැබූ බව විශ්වාස කෙරේ. ඉන්දියානු විශ්වාසයන්ට අනුව කැලෑ බළලා, වල් බළලා සහ කාන්තාර බළලා සිය රටෙහි හීලෑ කරන ලදැයි පැවසේ.

ලොම් දිග සහ ලොම් කෙටි ප්‍රභේද දෙකකට ගැනෙන බළල් කුලයේ ගෘහාශ්‍රිතව වෙසෙන්නන් කෙටි ලොම් ගණයට අයත් ය. මිටි, ඉතා මෘදු මෙන් ම පැහැදිලි සමක් සහිත ය. පැහැයෙන් මිශ්‍ර වූ මෙන් ම තනි පැහැයේ බළලුන් මේ අතර වෙයි.

සියාමෙස් බළලා (Siamese) සාමාන්‍යයෙන් වර්ග දෙකකින් යුක්ත ය. ළා වර්ණ සිරුරකින් ද තද වර්ණයේ කන් වලින් ද සමන්විත ය. මොවුහු 1895 වර්ෂයේ දී එංගලන්තයෙන් ඇමරිකා එක්සත් ජනපදයට ගෙන්වා ගත්තෝය. තායිලන්තයේ පන්සල් භූමිවල සියාමෙස් බළලුන් මීට අවුරුදු 200 කට එපිට කාලයේ පටන් ම වාසය කොට ඇත. මොවුන් සියම් රජ බළලුන් ලෙස හඳුන්වනු ලබයි.

## බුරුම බළලා

1930 දී බුරුමයේ සිට ඇමරිකා එක්සත් ජනපදයට හඳුන්වාදුන් බුරුම බළලා සියම් බළලා ගේ ම දෙමුහුන් වීමක් ලෙස සලකනු ලබයි.

දුඹුරු පැහැපත් සමක් ඇති බුරුම බළලා ගේ දෙනෙත දීප්තිමත් රන් පැහැයක් ගනී.

## ඇබේසියානු බළලා

ඊජිප්තුවට අයිතිවාසිකම් කියන මෙම බළලා ගේ හඳුනාගැනීම අවුරුදු සිය ගණනක් පැරණි ය. කන් කෙටි ගෘහාශ්‍රිත බළලුන් ට සමාන හැඩ රුව ඇති මෙවුන් ගේ වර්ණ තද දුඹුරු පැහැයේ සිට රතු දුඹුරු වර්ණ අතරට ඇතුළත් ය.

## රුසියානු නිල් බළලා

කෙටි ඝනකම් ලොම් ඇති මෙම බළලා කෙටි ලොම් බළලුන් ගේ රජු ලෙස සලකනු ලබයි. දෙනෙත තද කොළ පැහැති ය. එංගලන්තයට ආවේණික විශේෂයකි.

## මැනක්ස් බළලා

වලිගය නොමැති මෙම බළලා ගේ පිටුපස ගාතය ඉදිරි ගාතයට වඩා දිගු ය. ඇතැම් මැනක්ස් බළලුන් වලිග කෙටි ස්වභාවයක් උසුලයි.

ලොම් දිග බළල් විශේෂ බිහිව ඇත්තේ පර්සියානු සහ අන්ගෝරා වර්ග දෙක දෙමුහුන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ය. ක්‍රි.ව. 1700 වර්ෂයේ දී වෙළෙඳ සංචාරකයන් විසින් ඇමරිකාවට රැගෙන ගිය ඇන්කාරා, සහ පර්සියානු බළලුන් දෙමුහුන් වීමෙන් ලොම් දිග බළලා උපත්තිය සිදු වීය.

ගෙදර දොර වාසයේ දී ගෘහාශ්‍රිතව වෙසෙන බළලා මිනිසුන් අතර සාමාජිකත්වය ලැබුයේ මීයන්ගෙන් සිදුවන හානිය අවම කර ගැනීමට ය. මීයන් මෙන්ම කුරුල්ලන් දඩයම් කිරීමේ හසුරුතාවය මෙම බළලා සතුය. ගොවියෝ සිය අස්වැන්න පාළු කරන කුරුල්ලෝ පළවා හැරීමට මොවුන් ඇති දැඩි කළහ.

ගෘහාශ්‍රිතව වෙසෙන බළලකුගේ බර රාත්තල් 9 සිට 17 දක්වා වේ. ඇතැම් බළලුන් රාත්තල් 25 ක් පමණ බරය. බැළලියකු ගේ බර රාත්තල් 6 සිට 10 අතර වෙයි. පැටවකුගේ උපත් බර අවුන්ස 3/1/2 ක් පමණ වුවද මුල් මාස හය තුළ මෙම බර රාත්තල දක්වා වර්ධනය වෙයි.

බළලුන්ගේ රැවුල් ගස් (Whisker) මඟින් ඔවුන් ගේ සංජානනය තහවුරු කරයි. සමෙහි ස්නායු සමඟ බද්ධව ඇති මෙම රැවුල් ගස් පරිසරය හඳුනා ගැනීමට මහෝපකාරීය.

රාත්‍රි කාලයේ දී ඇස් පෙනීම තීව්‍රය. දිවා කාලයේ දී ඇසෙහි කණිකාව සංකෝචනය වෙයි.

සම්පූර්ණ අඳුරේ දී ඇස් නොපෙනුන ද මන්දාලෝකයේ දී ඇස් පෙනීම ඉතා තියුණු ය.

බළලකු ගේ දත් සංඛ්‍යාව 30 ක් පමණ වන අතර උඩු ඇන්දෙහි දත් 16 ක් පමණ ද යටි ඇන්දෙහි දත් 14 ක් පමණ ද පිහිටයි. බළල් පැටවුනට මාස 5 ක් පමණ වන විට මෙම කිරි දත් වැටී වැඩිහිටි හෙවත් ස්ථිර දත් වර්ධනය වෙයි.

බළලකු ගේ පාදයේ ඇඟිලි 5 කි. ඉදිරි පාදයේ ඇඟිලි පහක් ද පසු පාදයේ ඇඟිලි 4 ක් ද ලෙසින් නිර්මාණය වී ඇති මෙම පාද ආධාරයෙන් ඔවුන් ශබ්ද නොනැගෙන සේ ගමන් කරයි. ගමන් කිරීමේ දී ඇඟිලි පමණක් භූමිය ස්පර්ශ කරයි. ඉදිරි පා ඇඟිලිවල රැඳෙන කුණු රොඩු මොළොක් ලී දඬු පහුරුැ ගෑමෙන් ඉවත් කර ගනී. පසු පාදයේ කුණු රොඩු දත් ආධාරයෙන් ඉවත් කර ගැනීම බළලා ගේ සිරිත ය.

බැළලියක් අවුරුද්දක් පමණ වූ තැනදී සිය දරුවන් වැදීම ආරම්භ කරයි. පැටවකු ගැබ දරා සිටින්නේ දින 63 ක් පමණකි. අවුරුද්දකට තුන් වතාවක් පමණ ලිංගික උත්තේජනය ඉහළ නගින අතර වරක දී බිහිකරන පැටවුන් ගණන 3 ත් 5 ත් අතර ය.ඇබේසියානු බළලා වරකට පැටවුන් දෙදෙනෙක් බිහි කරයි.

ඉතා පිරිසිදුව සිටීමට කැමැති බළලා සිය පාද කෙළ වලින් තෙමා මුහුණ සෝදයි. සිය ශරීරයේ ද කෙළ තවරා පිරිසිදු කොට ගනී. පස බුරුල් ස්ථානයක වළක් හාරා මළපහ කොට ඒවා වසා තැබීම බළලා ගේ සිරිතයි.

පශු විද්‍යාඥ ෆර්ඩිනන්ඩ් බෘනර් සඳහන් කරන අන්දමට ගෘහාශ්‍රිතව වෙසෙන බළලුන්ට සිය ආශ්‍රයේ සිටින උදවිය හඳුනා ගැනීමේ විශේෂිත වු ඉන්ද්‍රියයන් 3 ක් ඇත. ඒවා නම් බළල් රැවුල, ඇස් සහ කනය. සිය ස්වාමියා යාර 110 ක දුරක සිට හඳුනා ගැනීමේ හැකියාව බළලුන්ට ඇත. ඔවුන් ගේ අක්ෂි ගෝලය පිටුපසින් වු විශේෂ (Patch)ඉන්ද්‍රිය කණ්ණාඩියක් සේ ක්‍රියා කරනු ලබයි. ඇස ආශ්‍රයෙන් පරාවර්තනය වීමේ මෙම විශේෂ ශක්තිය නිසාම රාත්‍රී කාලයේ දී බළලෙකුගේ දෙනෙත් දෙස සෘජුව බැලීමේ දී දිලිසෙන ස්වභාවයක් උසුලයි.

බළලුන්ගේ ශ්‍රවණ ශක්තිය ඉතා ප්‍රබලය. සිය හිස හැරවීමකින් තොරව ශබ්ද ග්‍රහණය කර ගැනීමේ ශක්තියෙන් බළලුන් පොහොසත්ය. නිදා සිටින බළලකුට අඩි 50 ක දුරින් සිටින විට මීයකු හඳුනා ගත හැකිය. අවදිව සිටින බළලා සහ මීයාගේ දුර සීමාව අඩි 5 සිට 6 අතර නම් සඟවා සිටි නියපොතු පිටතට ගනී. එතැන් සිට පැන පහර දීම ආරම්භ කරයි.

ඇමරිකාවේ මොළය පිළිබඳ විශේෂඥ වෛද්‍ය ප්‍රෑන්ක් මොරල් සඳහන් කරන අන්දමට බළලුන්ගේ ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු වෙනුවෙන් මොළයේ ඉදිරි කලාපය විශේෂ මෙහෙයක් කරයි. සිහින් විද්‍යුත් ඉලෙක්ට්‍රෝන තැන්පත් කිරීමෙන් ලබා ගත් තොරතුරු පෙන්වා දෙන අන්දමට ස්නායු සෛල වලින් 30% පෙනීම සමඟ සම්බන්ධ අතර ඒවා ශ්‍රවණය වෙනුවෙන් ද ප්‍රතික්‍රියා දක්වයි. "මහාචාර්ය ලේහසන්" සඳහන් කරන්නේ පන්සලේ ඝණ්ඨාව,පාසලේ සීනුව, තැපැල්කරු ගේ බයිසිකල් සීනුව වැනි සිද්ධීන් හි අනන්‍යතාවය බළලුන් හඳුනා ගන්නා බවයි.

බළලුන් රංචු වශයෙන් හැසිරෙන සත්ත්ව විශේෂයක් නොවුන ද ඔවුන් තමන් ගේ වර්ගයා සමඟ සමාගම් පවත්වන බව මහාචාර්ය ලේහසන් සඳහන් කරයි. බළලුන් 10 – 20 අතර සංඛ්‍යාවක් මෙම සමාගමට සම්බන්ධ වන අතර පැයක දෙකක කාලයක සිදු වෙන මෙම සමාගමේ දී ඔවුන් ගේ මුහුණේ ඉරියව් ඉතා වෙනස් බවත් සත්ත්ව හැසිරීම පිළිබඳ නිරීක්ෂණයේ යෙදෙන විශේෂඥයෝ සඳහන් කරති.

බළලුන්ගේ පූරු පූරු (Paur)නාදය ඔබ බොහෝ විට අසා ඇත. බළලකු සතුටට පත්වන විට මෙම පුරු පුරු ශබ්දය නිකුත් කරනු ලබයි. එමෙන්ම මව් බැළලිය සිය බිළිඳු දරුවන්ට තමා සිටින ඉසව්ව පිළිබඳ සන්නිවේදනය ලබා දෙන්නේ ද මෙම ශබ්දය ආශ්‍රය කර ගෙනය. උපත ලබන විට ම බළල් පැටවුනට ශබ්ද ගන්ධ සංවේදනය නොමැත. මේ නිසා මව් බැළලිය පූරු පූරු ශබ්දය නගන විට පැටවුන් ඇයට සමීප වේ. කිරි එරීම ආරම්භ වූ විට මව් බැළලිය ගේ පූරු පූරු ශබ්දය නතර වෙයි. බිය කෝපය ඇති විට සිය ශරීරය විශාල වන ලෙස පුම්බා ගැනීම බළලුන් ගේ සිරිතයි.

බළලුන් ගේ ආයු කාලය අවු 12 සිට 14 අතරය. ගෙදර දොර ආශ්‍රයේ පිළියෙළ වන ආහාර මෙන්ම දඩයම් කර ගන්නා සතුන් ද ආහාරයට ගැනීම බළලුන් ගේ ස්වභාව යයි. සිය සිරුරට අවශ්‍ය පෝෂණය ලබා ගැනීමට මේ අන්දමට සතුන් දඩයම් කරයි. බළලුන් සිය පැටවුන් ආහාර කර ගන්නේ ද ඔවුනගේ යකඩ පිළිබඳ ඌණතාවය සපුරා ගැනීම සඳහා බැව් සත්ත්ව ගති පුරුදු පිළිබඳ අධ්‍යයනයේ යෙදෙන පර්යේෂකයෝ සඳහන් කරති.

**පූනයා චාන්දනි ද සිල්වා**

